# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/32 - 2022 දෙසැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු ආඥාපනත යටතේ නිවේදනයයි

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2022)

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2022 දෙසැම්බර් මස 08 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභා වාරයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. මහින්ද සිරිවර්ධන,
ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

2022 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

### යෝජනාව

මෙම යෝජනාව *ගැසට් පත්‍රයෙහි* නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වූ 2021 මාර්තු මස 24 වැනි දිනැති අංක 2220/42 දරන *ගැසට්* නිවේදනයේ ඇමුණුම 11හි රේගු බද්දෙන් නිදහස් භාණ්ඩ ලැයිස්තුව (ආනයන) සඳහා, අංක 41 වශයෙන් සඳහන් නව අයිතමය ඇතුළත් විය යුතු බවට, මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

41. සහනදායී පියවර වශයෙන් ලබාදීමට හෝ අත්‍යවශ්‍ය මහජන සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා ව්‍යාපාරික ආයතන, ස්වේච්ඡා සංවිධාන හා හිතෛෂීන් ද ඇතුළුව යම් විදේශ රාජ්‍යයන් (රජයන්), සංවිධාන වෙතින් යම් රාජ්‍ය ආයතනවලට, රජය මගින් අනුමත ආයතනවලට හා යම් රාජ්‍ය ආයතන සමග සෘජු සහයෝගීතාවයෙන් සහන ක්‍රියාකාරකම්වල නියුක්ත ආයතනවලට ආධාර/පරිත්‍යාග වශයෙන් ලැබීමට නියමිත අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයන පහත කරුණුවලට යටත්වනු ලැබේ ;

(අ) පරිත්‍යාග සහ සහන පියවර සමග සම්බන්ධිත රාජ්‍ය ආයතන හෝ රජය විසින් අනුමත ආයතන හෝ සෘජුව සම්බන්ධීකරණ කටයුතු කරන රජයේ ආයතන භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ (ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා) නිර්දේශය. එකී එක් එක් අවස්ථාව මත පදනම්ව; (i) අදාළ පරිත්‍යාගය ලබාදීමෙන් අපේක්ෂිත කාර්යය හා ඉලක්කගත ප්‍රතිලාභීන් පිළිබඳව තමා විසින් සෑහීමකට පත්වීමෙන් අනතුරුව පමණක් ලේකම්වරයා විසින් රේගු ආනයන තීරුබද්ද ඉවත් කිරීම සඳහා සිය නිර්දේශය ලබාදිය යුතු ය; සහ (ii) එකී නිර්දේශ ලිපිය නිකුත් කරන ලේකම්වරයා (ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා) වෙත, එසේ පරිත්‍යාග කරන භාණ්ඩ භාරදිය යුතු ය ඃ

(ආ) යථොක්ත (අ) හි සඳහන් නිර්දේශය ලැබීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සියලු පරිත්‍යාග අනුමත කළ යුතු ය ;

(ඇ) අපේක්ෂිත කාර්යය (කාර්යයන්) සඳහා හා ප්‍රතිලාභීන් වෙත නොමිලේ ලබාදීම සඳහා එවැනි භාණ්ඩ ලබාදීම හෝ බෙදා හැරීම සිදුවන තෙක් යථොක්ත (අ) හි සඳහන් ලේකම් (ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා) විසින් මෙම කාර්ය පරිපාටිය යටතේ ආධාර/පරිත්‍යාග වශයෙන් ලැබෙන භාණ්ඩ සඳහා වගකීම හා වගවීම දැරිය යුතු වේ, සහ

(ඈ) භාණ්ඩාගාර ලේකම්වරයාගේ පූර්ව අනුමැතියක් ලබාගැනීමෙන් තොරව මෙම කාර්ය පරිපාටිය යටතේ ආධාර/පරිත්‍යාග වශයෙන් ලැබෙන භාණ්ඩ ඉහත සඳහන් කෙරෙන කාර්යය හැර වෙනත් කාර්යයන් වෙනුවෙන් විකිණීම, බැහැර කිරීම හෝ භාවිතා කිරීම සිදුකළ නොහැකි වේ. මෙම කාර්ය පරිපාටිය උල්ලංඝනය වන අවස්ථාවක දී, අදාළ බදු අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගු අධක්ෂ ජනරාල්වරයා විසින් රේගු ආඥාපනතේ විධිවිධාන යටතේ ක්‍රියාමාර්ග ගත යුතු වේ.

EOG 12 - 0274

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.